# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2006 අප්‍රේල් මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 අප්‍රේල් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 12.25 යි. තැපැල් ගාස්තුව : රු. 7.50 යි

# 2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 අප්‍රේල් මස 24 වන දින]

එල්. ඩී.— ඕ. 14/2003.

දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා ද, ඇතැම් අලුත් වැරදි සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(1) මේ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනි යම් ක්‍රියාවකට හෝ නොකර හැරීමකට වරදකරුවන සෑම තැනැත්තෙක්ම, එම ක්‍රියාව හෝ නොකර හැරීම—

(අ) සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් ශ්‍රී ලංකාව ඇතුළත දී සිදුකරනු ලැබුවේ නම් ;

(ආ) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය හෝ ගුවන් තීරය ඇතුළත දී සිදුකරනු ලැබුවේ නම් ;

(ඇ) සිදුකළ අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ ලියාපදිංචිකර ඇති යම් නෞකාවක් හෝ ගුවන් යානයක් කවර ස්ථානයක තිබුණ ද එම නෞකාව හෝ ගුවන් යානය ඇතුළත දී එම ක්‍රියාව හෝ නොකරහැරීම සිදු කරනු ලැබුවේ නම් ;

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි, ශ්‍රී ලාංකික දූත මණ්ඩලයක පරිශ්‍රයක් තුළ දී හෝ ඒ දූත මණ්ඩලයේ ප්‍රධානියාගේ හෝ තානාපති නියෝජිතයකුගේ හෝ එම දූත මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුගේ නිවස තුළ දී සිදුකරනු ලැබුවේ නම් ; හෝ

2-P L 000606-4,500 (2005/08)

(ඉ) ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් හෝ එහි පාලනය යටතේ නැතහොත්, ශ්‍රී ලංකාවේ ස්ථාපිත යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වෙනුවෙන් හෝ එහි පාලනය යටතේ පදිංචිය දරන්නාවූ ද, ශ්‍රී ලංකා ජනරජයෙන් බැහැරව පිහිටියා වූ ද, යම් පරිශ්‍රයක් ඇතුළත සිදු කරනු ලැබුවේ නම්,

අන්‍යාකාරයෙන් නොව මේ සංග්‍රහය යටතේ දඬුවම් ලැබීමට යටත් වන්නේ ය.”

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

“(2) මේ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් වරදකරු වන්නා වූ ශ්‍රී ලංකා ජාතිකයකු යම් විදේශීය රාජ්‍යයක තානාපති තත්ත්වයන් දැරීමේ හේතුවෙන් එම ජාතිකයා වෙත එම විදේශීය රාජ්‍ය විසින් ප්‍රදානය කර ඇති රාජ්‍ය දූත මුක්තිය භුක්ති විඳින්නේ වුව ද ඒ සෑම ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදු කරන එම ජාතිකයා අන්‍යාකාරයකින් නොව මේ සංග්‍රහය යටතේ දඬුවම් ලැබීමට යටත් වන්නේ ය.”

(3) එම වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

“සංග්‍රහය යටතේ වූ වැරදි සම්බන්ධයෙන් වගකිව යුතු බව.”

ප්‍රධාන ප්‍රඥප්තියට 286ආ සහ 286ඇ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 286අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 286ආ සහ 286ඇ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

“ළමයකු ලිංගික අපයෝජනය කිරීම වැළැක්වීම පරිගණක මගින් සේවා සපයන තැනැත්තකුගේ කාර්යය බව.

286ආ. (1) පරිගණකයක් මගින් සේවා සපයන තැනැත්තකු විසින් ළමයකු ලිංගික අපයෝජනය කිරීම සම්බන්ධයෙන් වරදක් සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා එම පරිගණක පහසුකම භාවිත නොකරන බවට සහතික වීම පිණිස අවශ්‍ය සියලු පියවර ගත යුතු ය.

(2) ළමයකු ලිංගික අපයෝජනය කිරීම සම්බන්ධයෙන් වරදක් සංයුක්ත වන ක්‍රියාවක් සිදුකිරීම

සඳහා (1) වන උපවගන්තියේ සඳහන් යම් පරිගණක පහසුකමක් භාවිත කරනු ලබන බවට තමා දන්නා (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින් ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත එම ක්‍රියාවට අදාළව එම කරුණු පිළිබඳව වහාම දැනුම් දී එම ක්‍රියාව සම්බන්ධයෙන් සහ උද්දේශිත වරදකරුගේ අනන්‍යතාවය ද සම්බන්ධයෙන් තමා සතු තොරතුරු එම නිලධරයා වෙත හෙළිකරනු ලැබිය යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තිවල විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරුවන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ එම බන්ධනාගාර ගත කිරීම සහ දඩය යන දෙකටම ඔහු යටත් විය යුතු ය.

(4) මේ වගන්තියේ "ළමයකු" යන්නෙන් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ.

ළමා අපයෝජනය සඳහා පරිශ්‍රයක් භාවිත කරන බවට දැනුම් දීමට ඇති කාර්ය භාරය.

286ඇ. (1) ළමයකු අපයෝජනය කිරීම සංයුක්තවන ක්‍රියාවක් සිදු කිරීම සඳහා යම් පරිශ්‍රයක් භාවිත කරමින් සිටින බවට දැන ගැනීමට ලැබෙන එම පරිශ්‍රය භාරව සිටින හෝ එම පරිශ්‍රයට රැකවරන ලබා දෙන, එය පාලනය කරන හෝ එහි සන්තකය දරන යම් තැනැත්තෙක් එසේ දැන ගැනීමට ලැබුණුවිට එම කරුණ පිළිබඳව ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත වහාම දැනුම් දිය යුතු ය.

(2) ළමයකු අපයෝජනය කිරීම සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා එම පරිශ්‍රය භාවිත කරනු ලබන බව ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත දැනුම්දීම පැහැර හරින (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත

කිරීමකට හෝ දඩයකට නැතහොත් එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම ඔහු යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ "ළමයකු" යන්නෙන්, වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 308අ වගන්තිය සංශෝධනය කිරීම.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 308අ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන පැහැදිළි කිරීම එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"**පැහැදිළි කිරීම** :" "හානි" යන්නට මනෝවිද්‍යාත්මක හෝ මානසික කම්පනය ද ඇතුළත් වේ."

ප්‍රධාන ප්‍රඥප්තියේ 345 වගන්තිය සංශෝධනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 345 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "පැහැදිළි කිරීම 2" යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන පැහැදිළි කිරීම ආදේශ කිරීමෙන් :—

"**පැහැදිළි කිරීම 2** : මේ වගන්තියේ කාර්ය සඳහා, අඩම්තේට්ටම් කිරීමට 363 වන වගන්තිය යටතේ ස්ත්‍රී දූෂණය බවට පත් නොවන යම් ක්‍රියාවක් හෝ 365ආ වගන්තිය යටතේ වූ බරපතල ලිංගික අපයෝජනයක් නොවන යම් ක්‍රියාවක් ඇතුළත් විය හැකි ය.".

(2) ඒ වගන්තියේ පැහැදිළි කිරීම 2 ට ඉක්බිතිව ම පහත දැක්වෙන පැහැදිළි කිරීම එකතු කිරීමෙන් :—

"**පැහැදිළි කිරීම 3** : "හානි" යන්නට මනෝවිද්‍යාත්මක හෝ මානසික කම්පනය ද ඇතුළත් වේ."

"අපහරණය සහ පැහැරගෙන යාම" යන ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 350 වන වගන්තියට පෙරාතුව ම දැක්වෙන ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ශීර්ෂය ආදේශ කරනු ලැබේ :—

"අපහරණය, පැහැරගෙන යාම සහ වහල්කම ආදිය"

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 358අ වගන්තිය ඇතුළත් කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ **358** වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ **358**අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"ණය බැඳුම්කරයට හෝ දාසභාවයට පත් කිරීම, බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම, වහල්කමට භාජනය කිරීම සහ යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම.

**358**අ. (1) (අ) යම් තැනැත්තකු, ණය බැඳුම්කරයකට හෝ දාසභාවයට පත් කරවන හෝ එසේ පත් කරවීමට සලස්වන ;

(ආ) යම් තැනැත්තකු බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීමට යටත් කරවන හෝ එසේ යටත් කිරීමට සලස්වන ;

(ඇ) යම් තැනැත්තකු වහල්කමට භාජනය කරවන හෝ එසේ භාජනය කිරීමට සළස්වන ; හෝ

(ඈ) සන්නද්ධ අරගලයක දී යෙදවීම සඳහා යම් ළමයකු යොදා ගන්නා හෝ බඳවා ගන්නා,

තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේද යටතේ වූ වරදකට වරදකරු වන යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ දඩයකට ද (1) වන උපවගන්තියේ (අ), (ආ), හෝ (ඇ) ඡේදයන් යටතේ ළමයකුට අදාළව හෝ (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ වරදක් සිදු කරනු ලබන අවස්ථාවක අවුරුදු තිහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

(3) මේ වගන්තියෙහි—

"ණය බැඳුම්කරය" යන්නෙන්, ණයක් සඳහා ඇපයක් වශයෙන් ණයකරුගේ හෝ

ඔහුගේ පාලනය යටතේ සිටින තැනැත්තකුගේ පුද්ගලික සේවාවල සාධාරණ ලෙස තක්සේරු කරන ලද වටිනාකම ණය මුදලට එරෙහිව හිලව් කරනු නොලැබුවේ නම් සහ එම සේවාවල කාලසීමාව සහ ස්වභාවය නිශ්චිතව පෙන්නුම් කොට නැත්නම්, එම සේවා ඔඩපනය කිරීමකින් පැන නගින ණයකරුගේ තත්ත්වය හෝ ඔහු සිටින ස්ථාවරය අදහස් වේ ;

"බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම" යන්නෙන් පහත සඳහන් කර ඇති වැඩ හෝ සේවා හැර, යම් දණ්ඩන නියමයක තර්ජනය යටතේ එම තැනැත්තාගෙන් ලබා ගන්නා සහ එම තැනැත්තා විසින් ඉටුකිරීම සඳහා සිය කැමැත්තෙන්ම ඉදිරිපත් නොවූ සියලු වැඩ සහ සේවා අදහස් වේ :—

(අ) අනිවාර්ය හමුදාමය සේවයට තත්කාලයේ අදාළ වන්නා වූ යම් නීති නිසාවෙන් පැන නගින හුදෙක් හමුදාමය ස්වභාවයක වැඩකට හෝ සේවයකට අදාළ යම් වැඩක් හෝ සේවයක් ;

(ආ) සම්පූර්ණ ස්වයං පාලනයක් ඇති රටක පුරවැසියන්ගේ සාමාන්‍ය ප්‍රජා වගකීම්වල කොටසක් වන යම් වැඩක් හෝ සේවයක් ;

(ඇ) යම් අධිකරණයක් විසින් පනවන ලද දඬුවමක් වශයෙන් යම් තැනැත්තකුගෙන් ගනු ලබන යම් වැඩක් හෝ සේවයක් : එසේ වුව ද, එම වැඩ හෝ සේවය රාජ්‍ය බලධරයකුගේ අධීක්ෂණය හා පාලනය යටතේ සිදු කළ යුතු අතර,

එම තැනැත්තා පුද්ගලයන් හෝ සමාගම් හෝ සංවිධාන විසින් කුලියට ගෙන නොතිබිය යුතු ය : නැතහොත් එම පුද්ගලයන්ගේ හෝ සමාගම්වල හෝ සංවිධානවල සේවය සඳහා නොයොදා තිබිය යුතු ය ;

(ඈ) හදිසි අවස්ථාවන්හි දී ඉටුකර ගනු ලබන වැඩ හෝ සේවා ; එනම් යුද්ධයක් ඇති වූ විට හෝ ගින්නක්, ජල ගැල්මක්, සාගතයක්, භූමි කම්පාවක්, තදබද ජන්තු රෝග වසංගතයක්, සත්තු, කෘමි හෝ එළවලු පරපෝෂිතයන් විසින් ආක්‍රමණය කිරීම වැනි උවදුරක දී හෝ උවදුරු තර්ජනයක දී සහ පොදුවේ සම්පූර්ණ ජනගහනයේ හෝ ඉන් කොටසක පැවැත්ම හෝ යහපතට තර්ජනයක් විය හැකි යම් අවස්ථානුගත කරුණක දී සිදු කරනු ලබන වැඩ හෝ සේවා ;

(ඉ) යම් ජන සමාජයක සෘජු යහපත උදෙසා එම ජනසමාජයේ සාමාජිකයන් විසින් ඉටු කරනු ලබන්නා වූ ද, එමගින් එය එකී ජනසමාජයේ සාමාජිකයන් වෙත පැවරුනු සාමාන්‍ය ප්‍රජා වගකීම් ලෙස සලකනු ලබන්නා වූ ද සුළු සේවා : එසේ වුව ද එම සේවාවල අවශ්‍යතාවය සම්බන්ධයෙන් එම ජන සමාජයේ සාමාජිකයන්ගෙන් හෝ ඔවුන්ගේ සෘජු නියෝජිතයන්ගෙන් අදහස් විමසනු ලැබීමේ අයිතිය ඔවුන්ට තිබිය යුතු ය. ;

“දාස භාවය” යන්නෙන්, ප්‍රතිලාභයක් සඳහා හෝ එසේ නැතිව සහ තම තත්ත්වය

වෙනස් කිරීමට නිදහසක් නොමැතිව වෙනත් තැනැත්තකුට අයත් ඉඩමක පදිංචිවීමට සහ වැඩ කිරීමට සහ එම තැනැත්තාට තීරණාත්මක සේවයක් ලබා දීමට නීතිය මගින්, චාරිත්‍ර මගින් හෝ ගිවිසුමක් අනුව බැඳී සිටින කුලී නිවැසියකුගේ තත්ත්වය හෝ ස්ථාවරය අදහස් වේ ;

"වහල්භාවය" යන්නෙන් හිමිකාරත්වයේ අයිතිවාසිකම්වලට බද්ධ වී ඇති යම් බලතල හෝ සියලුම බලතල ක්‍රියාත්මක කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාගේ තත්ත්වය හෝ ස්ථාවරය අදහස් වේ ;

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු 18 ට අඩු තැනැත්තකු අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 360ඇ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 360ඇ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"තැනැත්තන් වෙළෙඳාම් කිරීම.

360ඇ. (1) (අ) මුදල් හෝ වෙනත් ප්‍රතිශ්ඨාවක් සඳහා යම් තැනැත්තකු මිලදී ගන්නා, විකුණන හෝ හුවමාරු කරන නැතහොත් මිලදී ගැනීමට, විකිණීමට හෝ හුවමාරු කිරීමට වෙනත් තැනැත්තකු පොළඹවන නැතහොත් යම් තැනැත්තකු මිලදී ගැනීම, විකිණීම හෝ හුවමාරු කිරීම සඳහා ප්‍රවර්ධනය කිරීමට, පහසුකම් සැලසීමට හෝ පෙළඹවීමට යම් දෙයක් කරන ;

(ආ) බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම හෝ සේවය ලබා ගැනීමේ, වහල්භාවයේ යෙදවීමේ, පරවශතාවයේ, ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා

වෘත්තියේ යෙදවීමේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ හෝ යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා යොදා ගැනීමේ කාර්ය සඳහා තර්ජනය කිරීමෙන්, බලහත්කාරයෙන්, වංචාවෙන්, රැවටීමෙන්, පෙළඹවීමෙන් හෝ වෙනත් තැනැත්තකුගේ පීඩාකාරී තත්ත්වයකින් අයුතු ප්‍රයෝජන ගැනීමෙන් යම්, තැනැත්තකු බඳවා ගන්නා, ප්‍රවාහනය කරන, ස්ථානමාරු කරන, ආරක්ෂාව සලසා දෙන, භාර ගන්නා හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදුකරන ; හෝ

(ඇ) යම් ළමයකුගෙන් බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීමේ හෝ සේවය ලබා ගැනීමේ, එම ළමයා වහල්භාවයේ යෙදවීමේ පරවශතාවය හෝ ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා වෘත්තියේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ කාර්ය සඳහා හෝ යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා එම ළමයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව එම ළමයා සේවයට බඳවා ගන්නා, ප්‍රවාහනය කරන, මාරු කරන එම ළමයාට ආරක්ෂාව සලසා දෙන හෝ ළමයා භාර ගන්නා හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදු කරන,

කවර හෝ තැනැත්තකු, තැනැත්තන් වෙළෙඳාම් කිරීමේ වරදට වරදකරු වන්නේ ය.

(2) තැනැත්තන් වෙළෙඳාම් කිරීමේ වරද සිදු කරන යම් තැනැත්තෙක් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරත කිරීමකින් ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු අතර, දඩයකින් ද ඔහුට දඬුවම් කරනු ලැබිය හැකි ය ; තවද ළමයකු සම්බන්ධයෙන් එම වරද සිදු කරනු ලබන අවස්ථාවක, එම තැනැත්තාට අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, දඩයකින් ද ඔහුට දඬුවම් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියෙහි-

"ළමයා " යන්නෙන්, වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තකු අදහස් වේ ;

"බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම " යන්නට 358අ වගන්තියේ ඇති අර්ථයම තිබිය යුතු ය ;

"වහල් භාවය " යන්නට 358අ වගන්තියේ ඇති අර්ථයම තිබිය යුතු ය ;

"වෙනත් තැනැත්තකුගේ පීඩාකාරී තත්ත්වයකින් අයුතු ප්‍රයෝජන ගැනීම" යන්නෙන්, යම් තැනැත්තකුගේ ආර්ථික, සංස්කෘතික හෝ වෙනත් අවස්ථානුගත කරුණු වාසියට යොදා ගනිමින් කිසියම් ක්‍රියාවකට ඒ තැනැත්තා අවනතවීමට පෙළඹවීම අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 360ඇ සහ 360ඉ වගන්ති ඇතුළත් කිරීම.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 360ඈ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 360ඇ සහ 360ඉ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

"දරුකමට හදා ගැනීමට අදාළ වැරදි.

360ඇ. ළමයකු දරුකමට හදා ගැනීමේ කාර්ය සඳහා—

(i) යම් තැනැත්තකුගේ දෙමාපියන්ගෙන් කෙනකුගේ හෝ නෛතික භාරකරුගේ කැමැත්ත නොමැතිව යම් විදේශ රටකට ගමන් කිරීම සඳහා එම ළමයාට කටයුතු සලස්වා දෙන හෝ ආධාර කරන ;

(ii) යම් ගර්භනී කාන්තාවකගේ නූපන් ළමයා දරුකමට හදා ගැනීම සඳහා මුදල්වලට හෝ වෙනත් ප්‍රතිශ්ධාවක් සඳහා එම ගර්භනී කාන්තාවගේ ලිඛිත හෝ වාචික කැමැත්ත ලබා ගන්නා ;

(iii) ළමයින් දැරීමේ කාර්ය සඳහා කාන්තාවක් හෝ අඹු-සැමි යුවලක් බඳවා ගන්නා ;

(iv) උපත් ලියාපදිංචි කිරීම හා සම්බන්ධ තැනැත්තකු වන යම් තැනැත්තකු විසින්, උපත් ලියාපදිංචි කිරීම සඳහා භාවිත කරනු ලබන යම් ලේඛනයක් හෝ එම ලේඛනයේ අන්තර්ගත යම් උප්පැන්න වාර්තාවක් ව්‍යාජ ලෙස වෙනස් කිරීමට අවසර දෙන ;

(v) මුදල් හෝ වෙනත් ප්‍රතිශ්ධාවක් සඳහා ආරෝග්‍යශාලාවලින්, කාන්තා රැකවරණාහාර නිවාසවලින්, සායනවලින්, ළදරු පාසල්වලින්, දිවා සුරැකුම් මධ්‍යස්ථානවලින්, ළමයින් රැක බලා ගන්නා වෙනත් ළමා මධ්‍යස්ථානවලින් හෝ සුභ සාධක මධ්‍යස්ථානවලින් ළමයින් කුට්ටනය කිරීමේ නියැලී සිටින හෝ ළමයාගේ මවට හෝ වෙනත් තැනැත්තකුට තර්ජනය කිරීමෙන් දරුකමට හදා ගැනීම සඳහා එම ආයතනයෙන් හෝ මධ්‍යස්ථානයෙන් ළමයා කුට්ටනය කරන ; හෝ

(vi) ළමයාගේ මව සේ ව්‍යාජ ලෙස පෙනී සිටින හෝ එසේ ව්‍යාජ ලෙස පෙනී සිටීමට උපකාරී වන,

කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් නැතහොත් ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකින්ම ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියෙහි “ ළමයා ” යන්නෙන්, වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තෙක් අදහස් වේ.

ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම.

360ඉ. (1) ළමයකු ලිංගික අපයෝජනය කිරීමේ කාර්ය සඳහා—

(අ) වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තෙක් ; හෝ

(ආ) වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තකු බවට විශ්වාස කරනු ලබන යම් තැනැත්තෙක්,

ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිට කවර හෝ ආකාරයකින් පෙළඹවා ගැනීමට ඇවිටිලි කරන කවර හෝ තැනැත්තකු ළමයකු පෙළඹවා ගැනීමට ඇවිටිලි කිරීමේ වරද සිදු කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දහයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට නැතහොත් එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.” .

ප්‍රධාන ප්‍රඥප්තියේ 364 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 364 වන වගන්තියට ඇති 3 වන පැහැදිලි කිරීමට ඉක්බිතිව ම පහත දැක්වෙන පැහැදිලි කිරීම එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“ පැහැදිලි කිරීම 4 : “ හානි” යන්නට මනෝ විද්‍යාත්මක හෝ මානසික කම්පනය ද ඇතුළත් වේ.”

ප්‍රධාන ප්‍රඥප්තියේ 365 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 365 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ “ පැහැදිලි කිරීම ” යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

“ පැහැදිලි කිරීම 1 — ”

(2) එම වගන්තියේ පැහැදිලි කිරීම - (1) ට පසුව පහත දැක්වෙන අලුත් පැහැදිලි කිරීම එකතු කිරීමෙන් :—

“පැහැදිලි කිරීම 2 : “හානි” යන්නට මනෝ විද්‍යාත්මක හෝ මානසික කම්පනය ද ඇතුළත් වේ.”

**12**. ප්‍රධාන ප්‍රඥප්තියේ 365අ වගන්තිය එම වගන්තියේ අවසානයට ඉක්බිතිව ම පහත සඳහන් පැහැදිලි කිරීම එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 365අ වගන්තිය සංශෝධනය කිරීම.

"පැහැදිලි කිරීම : "හානි" යන්නට මනෝවිද්‍යාත්මක හෝ මානසික කම්පනය ද ඇතුළත් වේ."

**13**. ප්‍රධාන ප්‍රඥප්තියේ 365ආ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 365ආ වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි -

(අ) එම උපවගන්තියේ (අ) ඡේදයෙහි "අවුරුදු හතක්" යන වචන වෙනුවට "අවුරුදු පහක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම උපවගන්තියේ (ආ) ඡේදයෙහි "අවුරුදු දහයක්" යන වචන වෙනුවට "අවුරුදු හතක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ අවසානයට ඉක්බිතිව ම පහත දැක්වෙන පැහැදිලිකිරීම එකතු කිරීමෙන් :—

"පැහැදිලි කිරීම : "හානි" යන්නට මනෝවිද්‍යාත්මක හෝ මානසික කම්පනය ද ඇතුළත් වේ."

**14**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.